සියලුම හිමිකම් ඇවිරිණි]
*All Right Reserved]*

25.07.2016

Learning Resource Center

Accounting Accounting Accounting Accounting Accounting Accounting Accounting Accounting Accounting Accounting Accounting Accounting Account

ද මැසනොද් විදුහල, කඳාන
De Mazonod Collage, Kandana

**අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ**

**දෙවන වාර පරීක්ෂණය - 2016 ජූලි**

| | | |
|---|---|---|
| **ගිණුම්කරණය I** *Accounting I* | **13 ශ්‍රේණිය** *Grade 13* | **කාලය** පැය 02 |

❖ **නිවැරදි පිළිතුරු අංකය අදාළ කොටුව තුළ සටහන් කරන්න.**

01. ව්‍යාපාර ආයතනයක මූල්‍ය තත්ත්වය එම ව්‍යාපාරයේ,
   (1) වත්කම් තුළින් නිරූපණය වේ
   (2) වත්කම් හා වගකීම් තුළින් නිරූපණය වේ
   (3) වත්කම්, වගකීම් හා හිමිකම් තුළින් නිරූපණය වේ
   (4) වත්කම්, වගකීම්, හිමිකම් හා ආදායම්, වියදම් තුළින් නිරූපණය වේ
   (5) ලාභය තුළින් නිරූපණය වේ

02. ආයතනයක කාලච්ඡේදයේ ලාභය රු. 800 000 කි. ගැනිලි රු. 20 000 කි. වත්කම් වැඩිවීම රු. 100 000 කි. වගකීම් වැඩිවීම රු. 10 000 කි. අයිතිකරු කාලච්ඡේදය යොදා ඇති අමතර ප්‍රාග්ධනය කීය ද?
   (1) 60 000 (2) 100 000 (3) 90 000 (4) 30 000 (5) 40 000

03. ගිණුම්කරණයේ ගුණාංග වන්නේ,
   (1) වත්කම්, වගකීම්, හිමිකම්
   (2) ආදායම්, වියදම්
   (3) ලාභ අලාභ
   (4) වත්කම්, වගකීම්, හිමිකම්, ආදායම්, වියදම්
   (5) ආදායම්, වියදම්, ලාභ, අලාභ

04. පහත කුමන ගණුදෙනුව පොදු ජර්නලය තුළ සටහන් නොකරයි ද?
   (1) උපචිත දුරකථන ගාස්තු රු. 2 000
   (2) ණයගැතියකුගෙන් රු. 5 000 ක බොල් ණය කපා හැරීම
   (3) රු. 10 000 කාර්යාල උපකරණයක් ණයට ගැනීම
   (4) නැවත විකිණීමට රු. 5 000 ක උපකරණයක් ණයට ගැනීම
   (5) ඉදිරියට ගෙවූ රු. 5 000 රක්ෂණ ගාස්තු රු. 6 000 යි

05. පහත කුමන ගණුදෙනුව විකුණුම් ජර්නලයේ සටහන් කරයි ද?
   (1) ණයට විකුණුම් සියළුම වත්කම්
   (2) විකිණීමේ පරමාර්ථයෙන් කරන ලද සියළුම විකුණුම්
   (3) විකිණීමේ පරමාර්ථයෙන් කරන ලද ගැණුම් මුදලට විකිණීම
   (4) ණයට විකිණීමේ පරමාර්ථයෙන් කරන ලද සියළු විකුණුම්
   (5) විකිණීමේ පරමාර්ථයෙන් කරන ලද ගැණුම් ණයට විකිණීම

06. ආලෝක ලී බඩු වෙළෙඳාම් සමාගමේ ගණුදෙනු පහත දැක්වේ.
   - ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා රු. 80 000 ක් වටිනා ලී බඩු ණයට ගන්නා ලදී
   - නැවත විකිණීමේ පරමාර්ථයෙන් රු. 50 000 ක ලී බඩු ණයට ගන්නා ලදී
   - රු. 35 000 ක ලී බඩු ණයට විකුණන ලදී
   - රු. 20 000 ක ලී බඩු මුදලට විකුණන ලදී

   ඉහත ගණුදෙනු වාර්තා කිරීමට අදාළ මූලික පොත් නිවැරදි පිළිවෙලට දක්වා ඇති පිළිතුර තෝරන්න.
   (1) ගැණුම් ජර්නලය, පොදු ජර්නලය, විකුණුම් ජර්නලය, මුදල් පොත
   (2) පොදු ජර්නලය, ගැණුම් ජර්නලය, විකුණුම් ජර්නලය, මුදල් පොත
   (3) මුදල් පොත, පොදු ජර්නලය, විකුණුම් ජර්නලය, පොදු ජර්නලය
   (4) ගැණුම් ජර්නලය, ගැණුම් ජර්නලය, විකුණුම් ජර්නලය, විකුණුම් ජර්නලය
   (5) පොදු ජර්නලය, ගැණුම් ජර්නලය, මුදල් පොත, පොදු ජර්නලය

❖ ප්‍රශ්ණ අංක 07 සහ 08 සඳහා පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.

අයිතිකරු රු. 500 000 ක් යොදා 2015/04/01 ව්‍යාපාර කටයුතු ආරම්භ කළ අතර 2016/03/31 න් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු සපයා ඇත.

| | රු |
|---|---|
| මුළු ආදායම් | 400 000 |
| මුළු වියදම | 250 000 |
| ගැනිලි | 80 000 |
| මුළු වත්කම් | 600 000 |

07. 2016/03/31 දිනට මුළු වගකීම් කීය ද?

(1) 600 000 (2) 30 000 (3) 50 000 (4) 150 000 (5) 70 000

08. 2016/03/31 දිනට මුළු හිමිකම කීය ද?

(1) 500 000 (2) 600 000 (3) 650 000 (4) 570 000 (5) 420 000

09. ආයතනයක ගිණුම්කරණ ප්‍රකාශ කීපයක් පහත දක්වේ.

(A) අතීත ගණුදෙනුවක හෝ සිදුවීමක් මත ඇති වන අනාගත ආර්ථික ප්‍රතිලාභ ව්‍යාපාරයට ගලා ඒමේ හැකියාවක් පවතින ව්‍යාපාරය විසින් පාලනය කරන සම්පත් වත්කම් වේ.

(B) මූල්‍ය තත්ත්ව ප්‍රකාශය නිශ්චිත දිනකට පිළියෙල කරයි.

(C) යම් කාලච්ඡේදයකට අදාළ මෙහෙයුම් ප්‍රතිඵලය ගණනය කරන ප්‍රකාශය ආදායම් ප්‍රකාශණය වේ.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) B හා C පමණයි (3) A හා B පමණයි (5) සියළු ප්‍රකාශ වැරදිය

(2) A හා C පමණයි (4) A, B හා C යන සියල්ලම

10. 2016/03/31 සුළු මුදල් භාරකරු ළඟ රු. 1 000 ක් පැවතුන අතර ප්‍රධාන මුදල් භාරකරු විසින් එදින රු. 3 000 ක් ලබා දෙන ලදි. සුළු මුදල් අග්‍රිමය හා පෙබරවාරි මාසයේ සුළු වියදම වන්නේ,

(1) 3 000 ක් හා 2 000 ක් (3) 3 000 ක් හා 4 000 ක් (5) 3 000 ක් හා 1 000 ක්

(2) 4 000 ක් හා 3 000 ක් (4) 2 000 ක් හා 3 000 ක්

11. පහත ගණුදෙනු වලට අදාළ මූලාශ්‍ර ලේඛණය ඇතුළත් කාණ්ඩ අනුපිළිවෙල වන්නේ,

A. කාර්යාල උපකරණයක් ණයට ගැනීම C. උපචිත සේවක වේතනය

B. මුදලට විකුණුම් D. ණයහිමියන්ට භාණ්ඩ ආපසු යැවීම

(1) ජර්නල් වවුචරය, ඉන්වොයිසිය, ගෙවීම් වවුචරය, බැරපත

(2) ගැණුම් ඉන්වොයිසිය, ලදුපත, ජර්නල් වවුචරය, හරපත

(3) ජර්නල් වවුචරය, විකුණුම් ඉන්වොයිසිය, ගෙවීම් වවුචරය, හරපත

(4) ගෙවීම් වවුචරය, ලදුපත, ජර්නල් වවුචරය, බැරපත

(5) ගැණුම් ඉන්වොයිසිය, විකුණුම් ඉන්වොයිසිය, ගෙවීම් වවුචරය, හරපත

12. ආයතනයක ගැලපිලි සටහනක් පහත දක්වේ.

- උපචිත දුරකථන ගාස්තුව රු. 3 000

මේ ගණුදෙනුව නිසා මූලික ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම වන්නේ,

(1) වත්කම් වැඩි වීම හා වගකීම් අඩු වීමයි (4) වත්කම් අඩු වීම හා වගකීම් අඩු වීමයි

(2) වත්කම් වැඩි වීම හා හිමිකම වැඩි වීමයි (5) වගකීම් අඩු වීම හා හිමිකම අඩු වීමයි

(3) වගකීම් වැඩි වීම හා හිමිකම අඩු වීමයි

13. ආදායම් ප්‍රකාශණයක පරිපාලන පිරිවැය පමණක් ඇතුළත් කාණ්ඩය වන්නේ,

(1) රක්ෂණ ගාස්තු, වරිපනම් ගාස්තු, විකුණුම් සේවක වේතන

(2) බැංකු ගාස්තු, චෙක්පත් ගාස්තු, පොදු වියදම්

(3) ලිපි ද්‍රව්‍ය, රක්ෂණ ගාස්තු, දුන් වට්ටම්

(4) අයිරා පොලිය, ණය පොලිය, මුදල් වංචා අලාභය

(5) ගොඩනැගිලි අළුත්වැඩියා, දුරකථන ගාස්තු, සේවක වන්දි

14. පහත දක්වෙන්නේ ආයතනයක ගිණුම්කරණ පිළිවෙත් කිහිපයකි.

A. ශේෂ පිරික්සුම පිළියෙල කිරීම D. ගැලපිලි සටහන් දක්වීම

B. මූලාශ්‍ර ලේඛණ වල සටහන් කිරීම E. මූල්‍ය ප්‍රකාශණ පිළියෙල කිරීම

C. මූලික පොත් වල සටහන් කිරීම F. ගළපන ලද ශේෂ පිරික්සුම පිළියෙල කිරීම

(1) B C A D F E (2) C B A D E F (3) B C A D E F (4) A B C D E F (5) C B D A E F

Grade 12 3rd Term

25-07-2016

Learning Resource Center
De Mazenod College
Kandana

15. විකුණුම් පිරිවැය නිරූපණය වන්නේ,

A. විකිණීමට ඇති බඩු තොගය
D. විකුණුම් - දළ ලාභය
B. මුල තොගය + ගැනුම් පිරිවැය
E. විකිණීමට ඇති බඩු තොගය - අග තොගය
C. විකුණුම් - විකුණුම් පිරිවැය
F. විකුණු භාණ්ඩ වලට ගිය වියදම

(1) D පමණයි (2) A පමණයි (3) C, D හා E (4) D හා F (5) D, E හා F

16. ආයතනයක පහත වැරදි හා අත්හැරීම් සොයාගෙන ඇත.

1. රු. 5 000 ක විකුණුම් ඉන්වොයිසියක් රු. 500 ක් ලෙස ණයගැති ගිණුමට හර කර ඇත
2. රු. 3 000 ක් ලද වට්ටමක් දුන් වට්ටම් ගිණුමට හර කර තිබීම. මෙය නිවැරදිව ණයහිමි ගිණුමේ සටහන් කර ඇත
3. රු. 10 000 ක කාර්යාල උපකරණයක් ගැනීම ගැනුම් ගිණුමට හර කර තිබීම

වැරදි නිවැරදි කිරීමට පෙර අවිනිශ්චිත ගිණුම් ශේෂය වන්නේ,

(1) 6 000 බැර (2) 1 500 බැර (3) ඉහත සියල්ල වැරදියි (4) 6 000 හර (5) 1 500 හර

❖ ප්‍රශ්ණ අංක17 සහ 18 සඳහා පහත තොරතුරු අදාළ වේ.

2014/04/01 දින ගත් රු. 100 000 ක ණය සඳහා වාර්ෂික පොළිය 24% කි. එම ණය මුදලින් 1/5 ක් වාර්ෂික පොළියක් සමඟ 2015/04/01 ගෙවීමට බලාපොරොත්තු වේ. ගිණුම් වර්ෂ 2015/03/31 දිනෙන් අවසන් වේ. එම ගණුදෙනුවට අදාළ,

17. ජංගම වගකීම් වන්නේ,

(1) 24 000 (2) 44 000 (3) 24 800 (4) 20 000 (5) 12 400

18. ජංගම නොවන වගකීම් වන්නේ,

(1) 80 000 (2) 100 000 (3) 124 000 (4) 24 000 (5) 44 000

19. අයිතිකරුගේ ගැනිලි 15 000 ක් වැරදීමකින් විදුලි ගාස්තු ගිණුමට හර කර ඇත. මෙම වැරදි නිවැරදි කිරීමෙන්,

(1) හිමිකම් වෙනස් නොවේ
(2) හිමිකම අඩු වේ
(3) හිමිකම වැඩි වේ
(4) වියදම් වැඩි වේ
(5) ලාභය වැඩි වේ

20. විකුණුම්, ආපසු එවුම්, කලින් ලද ගොඩනැගිලි කුලිය, උපචිත විදුලි ගාස්තු, ගැනිලි එක් එක් ගිණුම් පිළිවෙලින් වර්ග කළ හැක්කේ,

(1) ආදායම්, ආදායම්, වගකීම්, වගකීම්, හිමිකම්
(2) ආදායම්, වත්කම්, වගකීම්, වත්කම්, හිමිකම්
(3) ආදායම්, වියදම්, වත්කම්, වගකීම්, වියදම්
(4) ආදායම්, ආදායම්, වත්කම්, වගකීම්, වියදම්
(5) වියදම්, ආදායම්, වගකීම්, වත්කම්, හිමිකම්

21. වන්දන රු. 200 000 කට ලකුණු කල භාණ්ඩ 10% ක වෙළෙඳ වට්ටමකට යටත්ව විකුණුම් මුදල් ලබා ගැනීමේදී 5% මුදල් වට්ටම දෙන ලදී.
ඉහත ගණුදෙනුවේ දුන් මුදල් වට්ටම වන්නේ,

(1) 20 000 (2) 10 000 (3) 4 500 (4) 9 000 (5) 24 000

22. නිව් ලංකා ලී බඩු සමාගම,

- ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා රු. 150 000 ක් වටිනා කාර්යාලීය ලී බඩු ද අලෙවි කිරීම සඳහා රු. 300 000 ක් වටිනා ලී බඩු උපකරණය ද ආලෝකා සහ සමාගමෙන් ණයට ගන්නා ලදී.
- ලී බඩු උපකරණ රු. 400 000 කට ණයට විකුණන ලදී.

ඉහත ගණුදෙනු වාර්තා කිරීමට අදාළ මුලික පොත් නිවැරදිව පිළිවෙලින් දක්වා ඇති පිළිතුර තෝරන්න.

(1) පොදු ජර්නලය, විකුණුම් දෛනික පොත
(2) පොදු ජර්නලය, ගැනුම් ජර්නලය, විකුණුම් දෛනික පොත
(3) ගැනුම් ජර්නලය, පොදු ජර්නලය, විකුණුම් දෛනික පොත
(4) පොදු ජර්නලය, ගැනුම් ජර්නලය, ණයගැති ගිණුම
(5) ගැනුම් ජර්නලය, විකුණුම් දෛනික පොත

23. A. වත්කමක වෙළෙඳපොළ අගය පොත්වල පෙන්වීම ඓතිහාසික පිරිවැය සංකල්පයට පටහැනිය
B. අයිතිකරුගේ පෞද්ගලික ජීවිත රක්ෂණ, ගාස්තුව ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශයෙහි සටහන් නොකිරීම ඒකක සංකල්පයට අනුකූල විමකි
C. අඩමාණ ණය සඳහා වෙන් කිරීම ආරක්ෂණ සිද්ධාන්තයෙන් බැහැර විමකි
ඉහත කුමන ප්‍රකාශ සත්‍ය ද?

(1) A හා B පමණි
(2) B හා C පමණි
(3) B පමණි
(4) A, B, C සියල්ලම
(5) C පමණි

24. විකුණුම් දෛනික පොත වඩාත් හොඳින් විස්තර කළ හැක්කේ,

(1) විකුණුම් ලැයිස්තුවක් වශයෙනි
(2) ණයට විකුණුම් ලැයිස්තුවක් වශයෙනි
(3) ගණුදෙනුකරුවන්ගේ ගිණුම් වල එකතුවක් වශයෙනි
(4) ද්විත්ව සටහන් ක්‍රමයේ කොටසක් වශයෙනි
(5) සියළුම විකුණුම් වල ලැයිස්තුවක් වශයෙනි

25. රු. 100 000 වටිනා යන්ත්‍රයක් 2013/04/01 දින රු. 50 000 කට විකුණා ඇත. එදිනට එහි ක්ෂය ප්‍රමාණය රු. 60 000 කි. යන්ත්‍ර විකිණීමෙන් ලද ලාභය වනුයේ,

(1) රු. 10 000 ලාභයකි
(2) රු. 10 000 අලාභයකි
(3) රු. 10 500 අලාභයකි
(4) රු. 10 500 ලාභයකි
(5) ඉහත කිසිවක් නොවේ

26. පහත තොරතුරු වලින් ආයතනයේ ණයහිමියන්ට සම්බන්ධ වේ.

- ණයහිමි ජර්නලයේ එකතුව රු. 250 වැඩියෙන් එකතු වී ඇත
- සුනිල් නැමති ණයහිමියාට ගෙවූ රු. 750, රු. 250 ලෙස ණයහිමි ජර්නලයේ සටහන් කර ඇත

පහත ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය වනුයේ,

(1) පාලන ගිණුමේ ශේෂ ලැයිස්තුවේ එකතුවට සමාන වේ
(2) ශේෂ පිරික්සුම සමාන වේ
(3) ශේෂ පිරික්සුමේ එකතුව 500 කින් වෙනස් වේ
(4) ශේෂ පිරික්සුමේ එකතුව රු. 250 කින් වෙනස් වේ
(5) ඉහත කිසිවක් නිවැරදි නොවේ

27. සීමිත ලක්රුවන් සමාගමේ රු. 400 000 ක් පිරිවැය වූ සහ රු. 350 000 ක සාධාරණ අගයක් සහිත යන්ත්‍රයක් සීමිත නිහාල් සමාගමට පවරා ඒ වෙනුවට රු. 500 000 සාධාරණ අගයක් සහිත යන්ත්‍රයක් නිහාල් සමාගමෙන් ලබා ගන්නා ලදි. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි යන්ත්‍රයේ වටිනාකම ලෙස හඳුනාගත යුත්තේ,

(1) රු 250 000 (2) රු 550 000 (3) රු 500 000 (4) රු 450 000 (5) රු 550 000

28. සමාගමක් 2016/06/30 දින අත්පත් කරගත් යන්ත්‍රයකට අදාළව පහත තොරතුරු සපයා ඇත.

| | |
|---|---|
| යන්ත්‍රයේ ලකුණු කළ මිල | 400 000 |
| ප්‍රධාන පිරිවැය | 20 000 |
| ස්ථානය සකස් කිරීමේ වියදම් | 30 000 |
| සවිකිරීම් පිරිවැය | 10 000 |
| මූලික පරීක්ෂණ පිරිවැය | 86 000 |

අත්පත් කරගත් අවස්ථාවේදී 10% වෙළඳ වට්ටම් ලැබුණි. මූලික පරීක්ෂණයේදී නිෂ්පාදනය කළ ඒකක රු. 200 ක් එකක් රු. 30 බැගින් අලෙවි කරන ලදි.

C.K.A.S-16 ට (දේපළ පිරියත උපකරණ) අනුව මූලික හඳුනා ගැනීමේ පිරිවැය කීය ද?

(1) 460 000 (2) 500 000 (3) 450 000 (4) 400 000 (5) 360 000

29. නිෂ්පාදන ආයතනයක් විසින් දරණ පහත කුමන පිරිවැය අයිතම සෘජු පිරිවැය ලෙස වර්ග කරයි ද?

A. නිෂ්පාදන කළමණාකරුගේ වැටුප
B. අමුද්‍රව්‍ය කම්හලට ගෙන ඒම සඳහා දරූ ප්‍රධාන පිරිවැය
C. නිෂ්පාදනය කරන ලද ඒකක ගණන මත සේවකයින්ට ගෙවූ වේතනය
D. කම්හලේ භාවිතා කරන යන්ත්‍රය මත ක්ෂය වෙන් කිරීම

(1) A, C හා D
(2) B හා C
(3) C පමණක්
(4) A පමණක්
(5) A, B, C, D

30. ආයතනයක ජූලි 01 ඉතිරි තොග ඒකක 200 කි. ඒකකයක ගැණුම් මිල රු. 20 කි. ජූලි 10 තොග ඒකක 100 ක් එකක් රු. 30 බැගින් මිලදී ගෙන ඇත. ජූලි 25 විකුණුම් ඒකක 150 කි. තොග මිල කරනුයේ ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් ක්‍රමය නම් (F.I.L.O) අවසාන තොගයේ වටිනාකම,

(1) 4 500 (2) 4 000 (3) 7 000 (4) 3 000 (5) 2 000

31. පහත එක් එක් ගණුදෙනුව වර්ග කිරීමට අවශ්‍ය මූලාශ්‍ර ලියවිල්ල සහ මූලික සටහන් පොත නම් කරන්න.

| ගණුදෙනුව | මූලාශ්‍ර ලියවිල්ල | මූලික සටහන් පොත |
|---|---|---|
| (1) අයිතකරු මුදලින් කළ ගැනිලි | ............................ | ............................ |
| (2) ගොඩනැගිලි ක්ෂය කිරීම් | ............................ | ............................ |
| (3) බැංකු ගාස්තු | ............................ | ............................ |
| (4) ගණුදෙනුකරුවන්ට දුන් මුදල් වට්ටම් | ............................ | ............................ |

32. ණයහිමි පාලන ගිණුම සහ ණයහිමි ලෙජරයේ ශේෂ ලැයිස්තුව ක්‍රියාවේදී පහත වැරදි හඳුනාගෙන ඇත.

- ගැණුම් දෛනික පොත රු. 50 000 ක් වැඩියෙන් එකතු කිරීම
- ණයහිමියකුගෙන් ලද වට්ටම් රු. 4 000 පොදු ලෙජරයේ හා උපලෙජරයේ සම්පූර්ණයෙන් අත්හැර තිබීම
- රු. 2 000 ක හර පතක් උප ලෙජරයේ 200 ක් ලෙස වර්ග කර තිබීම

ඉහත නිවැරදි කිරීම සඳහා කළ යුතු ගැළපීම වන්නේ,

(අ) ණයහිමි පාලන ගිණුමට .................................................................. කිරීමය.

(ආ) ණයහිමි ශේෂ ලැයිස්තුවට .......................................................... කිරීමය.

33. පහත ගිණුම් වත්කම්, වගකීම්, ආදායම්, වියදම්, හිමිකම් ගිණුමක්ද යන්න දක්වන්න.

| ගිණුම | වර්ගය |
|---|---|
| A. ක්ෂය වෙන් කිරීම් | .............................................................. |
| B. විකුණුම් අත්තිකාරම් ගිණුම | .............................................................. |
| C. ගැනිලි ගිණුම | .............................................................. |
| D. ලද රක්ෂණ වන්දි ගිණුම | .............................................................. |

34.

තරංග ආයතනය (A)

2016/03/31 දිනට (B)

මූල්‍ය තත්ත්ව ප්‍රකාශණය

| | |
|---|---|
| **ජංගම නොවන වත්කම්** | |
| දේපළ පිරියත උපකරණ (ධාරණ අගය) | 6 000 (C) |
| **ජංගම වත්කම්** | |
| තොගය | 3 000 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 1 500 → (D) |
| මුදල් | 500 |
| | 10 000 |

ඉහත එක් එක් අක්ෂරයට අදාළ සංකල්පය නම් කරන්න.

A - ..............................................................................................

B - ..............................................................................................

C - ..............................................................................................

D - ..............................................................................................

35. 2016/03/31 දිනට ආයතනයක බැංකුවෙන් ලද බැංකු ප්‍රකාශණයට අනුව ශේෂය වාසිදායක රු. 120 000 වේ. එදින මුදල් පොතේ ශේෂය සමාන විය. සමාන නොවිය. වෙනසට හේතු පහත දක්වේ.

1. බැංකු ප්‍රකාශණයේ ඇතුළත් වී ඇති බැංකු ගාස්තු රු. 10 000 හා ණයගැති ප්‍රේෂණ රු. 1 500 මුදල් පොතේ සටහන් වී නොතිබීම.
2. ව්‍යාපාරය තැන්පත් කර ඇති රු. 50 000 ක චෙක්පතක් හා නිකුත් කළ රු. 35 000 ක චෙක්පතක් බැංකු ප්‍රකාශණයේ සටහන් වී නොතිබීම.

අවශ්‍ය වන්නේ,

1. මුදල් පොතේ 2016/03/31 දිනට නිවැරදි බැංකු ශේෂය

..............................................................................................................................

2. බැංකු ප්‍රකාශණයේ ශේෂය

..............................................................................................................................

36. දේපළ පිරියත උපකරණ ඉවත් කිරීමට අදාළ පොදු ජර්නලයේ සටහන් කරන ගණුදෙනු වර්ග 2 ක් නම් කරන්න.

1. ..............................................................................................................................

2. ..............................................................................................................................

37. ආයතනය පිරිවැය රු. 600 000 ක් වටිනා ක්ෂය වෙන් කිරීම රු. 200 000 ක් වූ මෝටර් රථයක් රු. 450 000 කට පවරා යන්ත්‍රයක් රු. 520 000 කට අත්පත් කර ගන්නා ලදි. වෙනස මුදලින් ගෙවා ඇත.

අවශ්‍ය වන්නේ,

1. රථ ඉවත් කිරීමේ ලාභය .................................................. 2. යන්ත්‍රයේ සාධාරණ අගය ..................................................

38. නිෂ්පාදන ආයතනය මාර්තු මාසයේ පහත තොරතුරු සපයා ඇත.

| | |
|---|---|
| අමුද්‍රව්‍ය ගැනුම් | 200 000 |
| සෘජු වැටුප් | 100 000 |
| වෙනත් සෘජු වියදම් | 50 000 |
| නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය | 150 000 |
| විකුණුම් | 800 000 |
| <u>තොග වෙනස් වීම්</u> | |
| අමුද්‍රව්‍ය තොගයේ වැඩිවීම | 40 000 |
| නොනිමි තොගයේ අඩුවීම (ප්‍රාථමික පිරිවැයට) | 20 000 |
| නිමි තොගයේ වැඩිවීම | 30 000 |

අවශ්‍ය වන්නේ,

1. අමුද්‍රව්‍ය පිරිවැය .................................................. 3. නිෂ්පාදන පිරිවැය ..................................................

2. ප්‍රාථමික පිරිවැය .................................................. 4. විකුණුම් පිරිවැය ..................................................

39. ආයතනයක ගොඩනැගිලි කුලී සඳහා මැයි මාසයේ ගෙවන ලද රු. 24 000 ක චෙක්පතක් අගරු විය. ජුනි මාසය අවසානයේදී මැයි හා ජුනි මාසය වෙනුවෙන් රු. 48 000 ක චෙක්පතක් ගොඩනැගිලි කුලී සඳහා නිකුත් කරන ලදි. එය ජුනි මාසයේ පොත් වල වාර්තා කිරීමේ ජර්නල් සටහන් දක්වන්න.

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

40. පිරිවැය රු. 800 000 ක් වටිනා ඉඩමක් ප්‍රත්‍යාගණනයේදී වෙළෙඳපොළ අගය රු. 730 000 ක් විය. ඉඩම් ප්‍රත්‍යාගණනය කිරීමේ ජර්නල් සටහන් දක්වන්න.

..................................................................................................................................

..................................................................................................................................

41. ව්‍යාපාරයක පහත ගණුදෙනු හේතුවෙන් වත්කම්, වගකීම් හා හිමිකම් සඳහා වන බලපෑම "අඩු වේ" , "වැඩි වේ" , "වෙනස් නොවේ" ලෙස දක්වන්න.

(1) අයිතිකරු තම පෞද්ගලික මුදලින් උපචිත වියදමක් ගෙවීම

(2) ණයගැතියන්ගෙන් අඩමාණ ණය සඳහා වෙන් කිරීම

(3) බැංකු අයිරාවක් පවතින විට බැංකුවේ මුදල් තැන්පත් කිරීම

(4) ඉදිරියට ලද ගොඩනැගිලි කුලී

| වත්කම් | වගකීම් | හිමිකම් |
|---|---|---|
| .................... | .................... | .................... |
| .................... | .................... | .................... |
| .................... | .................... | .................... |
| .................... | .................... | .................... |

42. ව්‍යාපාරයක සුළු මුදල් අග්‍රිමය සම්බන්ධ තොරතුරු පහත දක්වේ.

| | | | <u>රු.</u> |
|---|---|---|---|
| සුළු මුදල් පොතේ ශේෂ | - | 2016/01/01 | 600 |
| | - | 2016/01/31 | 400 |
| ප්‍රතිපූර්ණය කිරීම | | 2016/01/01 | 1 900 |

සුළු මුදල් අග්‍රිමය රු. 500 කින් වැඩි කරමින් 2016/02/01 දින ප්‍රතිපූර්ණය කළ මුදල කොපමණ ද?

..................................................................................................................................

43. වත්කම් පිරිවැය සංකල්පයෙන් බැහැරව පොත් වල වාර්තා වන අවස්ථා 2 ක් නම් කරන්න.

..................................................................................................................................

..................................................................................................................................

44. පහත වැරදි මගින් ව්‍යාපාරයක ශේෂ පිරික්සුමේ වෙනසක් "ඇති වේද" , "ඇති නොවේද" යන්න දක්වන්න.

(1) රු. 40 000 ක විකුණුම් ඉන්වොයිසියක් පොත් වලින් මගහැරීම ..............................

(2) රු. 15 000 ක බැංකු අයිරාව වාසිදායක ශේෂයක් ලෙස ශේෂ පිරික්සුමට උපුටා ගැනීම ..............................

(3) රු. 4 000 ක දුන් වට්ටම් ලද වට්ටම් ගිණුමට හර කිරීම ..............................

(4) රු. 30 000 ක බොල් ණය කපා හැරීම පාලන ගිණුමේ සටහන් කලද අදාළ ණයගැති ගිණුමේ සටහන් නොවීම ..............................

45. වෙළෙඳ ව්‍යාපාරයක යෙදෙන සීමිත පොදු සමාගමක පහත එක් එක් අවස්ථාවට වඩාත් ගැළපෙන ගිණුම්කරණ සංකල්පය සඳහන් කරන්න.

| ගිණුම | සංකල්පය |
|---|---|
| A. මූල්‍ය තත්ත්ව ප්‍රකාශණයේ වත්කම් හා වගකීම් ජංගම හා ජංගම නොවන ලෙස වර්ග කිරීම | .............................. |
| B. සෑම කාලච්ඡේදයක් සඳහාම ආදායම් ප්‍රකාශණයක් පිළියෙල කිරීම | .............................. |
| C. වර්ෂය තුළ ගෙවූ කුලී රු. 500 000 ක් වුවත් ආදායම් ප්‍රකාශණයේ රු. 600 000 ක් ලෙස වාර්තා කර තිබීම | .............................. |
| D. මූල්‍ය කල්බදු ක්‍රමයට ලබා ගත් මෝටර් රථයක වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශණයේ වත්කමක් ලෙස හඳුනාගෙන තිබීම | .............................. |

❖ ප්‍රශ්ණ අංක 46 හා 47 සඳහා පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.

පහත සඳහන් තොරතුරු ව්‍යාපාරයක වත්කම් දෙකක් සම්බන්ධ වේ.

| වත්කම | පිරිවැය රු. 000 | ඵලදායී ජීව කාලය (වසර) | සුන්බුන් අගය රු. 000 | 2015/04/01 දිනට සමුච්චිත ක්ෂය රු. 000 |
|---|---|---|---|---|
| මෝටර් රථය | 4 000 | 10 | 400 | 1 800 |
| යන්ත්‍රය | 2 000 | 5 | 200 | 720 |

- 2015/04/01 දින මෝටර් රථ වැඩි දියුණු කිරීම සඳහා රු. 600 000 ක් වැය කරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස මෝටර් රථයේ ඉදිරි ඵලදායි ජීව කාලය වසර 06 ක් ලෙස ඇස්තමේන්තු කරන ලදි. සුන්බුන් අගය වෙනස් නොවේ.
- 2016/03/31 දින ව්‍යාපාරය සතු යන්ත්‍රය රු. 1 500 000 කට විකුණන ලදි.

46. 2016/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෝටර් රථ වාර්ෂික ක්ෂය වටිනාකම කොපමණ ද?

..............................................................................................................................................

47. යන්ත්‍රය ඉවත් කිරීමේ ලාභය / අලාභය කොපමණ ද?

..............................................................................................................................................

48. සීමිත රොෂාන් සමාගමේ මාසයක් සඳහා වූ සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම රු. 5 000 කි. මාස 04 ක් සඳහා වූ සුළු මුදල් ගණුදෙනු පහත වගුවේ දක්වේ.

| | පළමු මාසය | දෙවන මාසය | තුන්වන මාසය | හතරවන මාසය |
|---|---|---|---|---|
| ඉ/ගෙ/ශේෂය | 2 500 | A | 200 | D |
| මුදල් ලැබීම් | 2 500 | 4 200 | C | 4 100 |
| සුළු මුදල් වවුචර් වල වටිනාකම | 4 200 | B | 4 100 | 4 750 |

ඉහත වගුවේ A, B, C, D අක්ෂර වලින් දක්වෙන හිස්තැනට අදාළ වටිනාකම් ලියන්න.

1. A රු .............................................................. 3. C රු ..............................................................

2. B රු .............................................................. 4. D රු ..............................................................

49. හිස්තැනට සුදුසු වචනය තෝරා ලියන්න.

ඓතිහාසික පිරිවැය / විශ්වාසදායි බව / ආරක්ෂණය / ගැළපුම් සංකල්පය / ඒකාකාරී බව / ගිණුම් ප්‍රතිපත්තින් / උපචිත

1. ප්‍රත්‍යාගණන වටිනාකම මත දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීම .............................. ත් බැහැර වීමකි.

2. අනාගතයේ ඇති වන ලාභ ගිණුම්ගත නොකර අනාගතයේ ඇති විය හැකි අලාභ පමණක් ගිණුම්ගත කිරීම .............................. ට අනුකූල වේ.

3. ව්‍යාපාරයේ ජංගම නොවන වත්කම් ක්ෂය කිරීම සඳහා අනුගමනය කළ සරල මාර්ග ක්ෂය ක්‍රමය වෙනස් කර ප්‍රවර්ථන වර්ෂයේ සිට හීනවන ශේෂ ක්‍රමයට ක්ෂය කිරීම නිසා කඩවන්නේ ..............................................

4. ඉදිරි කාලච්ඡේදය සඳහා කළ ගෙවීම් හා ලැබිය යුතු ආදායම් වත්කම් ලෙස හඳුනා ගන්නේ .............................................. අනුවය.

50. වත්කමක සමුච්චිත ක්ෂය රු. 120 000 කි. සුන්බුන් අගය රු. 40 000 ක වාර්ෂික ක්ෂය රු. 20 000 කි. සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරයි නම් දැනට භාවිත කර ඇති වර්ෂ ගණන කොපමණ ද?

..............................................................................................................................................................

සියලුම හිමිකම් ඇවිරිණි]
All Right Reserved]

25.07.2016

ද මැසනොද් විද්‍යාලය, කඳාන
De Mazonod Collage, Kandana

# අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ
## දෙවන වාර පරීක්ෂණය - 2016 ජූලි

ගිණුම්කරණය II
Accounting II

13 ශ්‍රේණිය
Grade 13

කාලය
පැය 03

- ❖ පළමු හා දෙවන ප්‍රශ්නය ඇතුළත ප්‍රශ්න 6 කට පිළිතුරු සපයන්න.
- ❖ සෑම ප්‍රශ්නයක්ම අලුත් කඩදාසියකින් ආරම්භ කරන්න.

01. මධුර වෙළඳ ආයතනයේ 2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශේෂ පිරික්සුම් තොරතුරු පහත දක්වේ.

| | හර | බැර |
|---|---|---|
| දළ සේවක වේතනය | 100 000 | |
| ගෙවූ ගොඩනැගිලි කුලිය | 120 000 | |
| ප්‍රචාරණ ගාස්තුව | 40 000 | |
| ගෙවූ විකුණුම් කොමිස් | 30 000 | |
| විදුලි හා රක්ෂණ ගාස්තුව | 20 000 | |
| 10% ක ත්‍රෛමාසික භාණ්ඩාගාර බිල්පත් | 120 000 | |
| දුන් වට්ටම් | 5 000 | |
| ආපසු එවුම් | 25 000 | |
| ගැනිලි | 80 000 | |
| 2015/04/01 තොගය | 70 000 | |
| ගැණුම් | 400 000 | |
| කාර්යාල උපකරණ (පිරිවැය) | 300 000 | |
| බෙදා හැරීමේ රථය (පිරිවැය) | 500 000 | |
| වෙළඳ ලැබිය යුතු දෑ | 90 000 | |
| ස්ථාවර තැන්පතුව | 100 000 | |
| බැංකු ණය | | 120 000 |
| 2015/04/01 අඩමාණ ණය වෙන් කිරීම් | | 7 000 |
| 2015/04/01 කාර්යාල උපකරණ ක්ෂය වෙන් කිරීම් | | 75 000 |
| 2015/04/01 රථ ක්ෂය වෙන් කිරීම් | | 160 000 |
| ගෙවිය යුතු සේවක අර්ථ සාධක අරමුදල (සේවක දායකය) | | 10 000 |
| විකුණුම් | | 900 000 |
| ආපසු යැවුම් | | 15 000 |
| වෙළඳ ගෙවිය යුතු දෑ | | 63 000 |
| ලද වට්ටම් | | 10 000 |
| බැංකු අයිරාව | | 18 000 |
| ප්‍රාග්ධනය | | 622 000 |
| | 2 000 000 | 2 000 000 |

පහත කරුණු ගැළපීමට ඇත.

1. 2016/03/31 දිනට ඉතිරි තොගයේ පිරිවැය රු. 80 000 එහි ශුද්ධ උපලබ්ධි අගය රු. 75 000 කි.
2. දළ සේවක වේතන මත සේවක අර්ථ සාධක අරමුදල (EPF) හා සේවක භාරකාර අරමුදලට (ETF) ආයතනයේ දායකය පිළිවෙලින් 15% හා 5% වේ. මෙය තවම වර්ෂය සඳහාම ගෙවා නැත.
3. ගොඩනැගිලි කුලිය ගෙවා ඇත්තේ 2015/04/01 දිනට ඉදිරි වර්ෂ 2 ක සඳහාය.
4. අඩමාණ ණය වෙන් කිරීම ණයගැතියන්ගෙන් 10% කි.
5. කාර්යාල උපකරණ වාර්ෂික ක්ෂය රු. 25 000 කි.
6. මෝටර් රථයේ ජීව කාලය වර්ෂ 5 කි. සුන්බුන් අගය රු. 100 000 කි. සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරයි.

7. ස්ථාවර තැන්පතුව සිදුකර ඇත්තේ 2016/01/01 20% වාර්ෂික පොළියකටය. පොළිය තවම ලැබී නැත.
8. අයිතිකරු රු. 20 000 ක් වටිනා බඩු තොගයක් සිය පෞද්ගලික ප්‍රයෝජනයට ගෙන ඇතත් එය පොත් වල වාර්ථා කර නැත.
9. බැංකු ණය ලබාගෙන ඇත්තේ 2015/10/01 20% වාර්ෂික පොළියකටය. ණය පොළිය තවම ගෙවා නැත.
10. භාණ්ඩාගාර බිල්පත් සඳහා පොළිය ලැබී නැත. එම බිල්පත් මිලදී ගෙන ඇත්තේ 2016/02/01 දිනය.

අවශ්‍ය වන්නේ,

1. 2016/03/31 න් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශණය
2. 2016/03/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශණය

---

02. ආ) අකිල නිෂ්පාදන ආයතනයේ 2016 මාර්තු මාසය සඳහා නිෂ්පාදන තොරතුරු පහත දක්වේ.

| | හර |
|---|---|
| අමු ද්‍රව්‍ය ගැණුම් | 300 000 |
| සෘජු ශ්‍රම පිරිවැය | 150 000 |
| වෙනත් සෘජු පිරිවැය | 50 000 |
| 2016/03/01 තොග | |
| අමුද්‍රව්‍ය තොගය | 40 000 |
| නොනිමි තොගය (කම්හල් පිරිවැය) | 20 000 |
| නිමි තොගය | 25 000 |
| කම්හල් වක්‍ර ද්‍රව්‍ය පිරිවැය | 40 000 |
| කම්හල් කළමණාකරණ වේතනය | 35 000 |
| කම්හල් විදුලි ගාස්තු | 10 000 |
| කම්හල් රක්ෂණ ගාස්තු | 5 000 |
| කම්හල් දේපල ක්ෂය | 12 000 |
| අමු ද්‍රව්‍ය ගෙන ඒමේ කුලිය | 8 000 |
| ප්‍රචාරණ ගාස්තු | 20 000 |
| විකුණුම් | 1 000 000 |

අමතර කරුණු,

1. මාර්තු 31 තොග

| | |
|---|---|
| අමුද්‍රව්‍ය තොගය | 50 000 |
| නොනිමි තොගය (කම්හල් පිරිවැය) | 15 000 |

2. මාසය තුල පිරිවැය රු. 10 000 ක් වටිනා අමු ද්‍රව්‍ය තොගයක් හානි වී ඇතත් පොත් වල වාර්ථා කර නැත.

අවශ්‍ය වන්නේ,

1. අකිල නිෂ්පාදන ආයතනයේ මාර්තු මාසයේ නිෂ්පාදන ප්‍රකාශණය පිළියෙල කරන්න.
2. දළ ලාභය ගණනය කරන්න.

ආ) සුමුදු ආයතනය 2016 මැයි 01 රු. 400 000 ක මුදලක් යොදා ආරම්භ කල අතර පළමු මාසය තුල සිදු වූ ගණුදෙනු පහත දක්වේ.

| | |
|---|---|
| මුදලට ගැණුම් | 90 000 |
| ණයට ගැණුම් | 100 000 |
| මුදලට විකුණුම් | 120 000 |
| ණයට විකුණුම් | 80 000 |
| ණයහිමියන්ට මුදල් ගෙවීම් | 40 000 |
| ණයගැතියන්ගෙ මුදල් ලැබීම් | 13 000 |
| වියදම් ගෙවීම | 30 000 |

1. ණයගැතියන්ගෙන් රු. 10 000 ක මුදල් වට්ටම් ලැබුණු අතර ණයහිමියන්ට රු. 5 000 මුදල් වට්ටම් දෙන ලදි.
2. පහත වැරදි සිදුවී ඇත.
   i) රු. 6 000 ක ගැණුම් ඉන්වොයිසියක් පොත් වලින් සම්පූර්ණයෙන් අත්හැරීම
   ii) ආපසු යැවුම් රු. 8 000 ක් ණයට විකිණීමක් ලෙස සටහන් කර තිබීම
   iii) මාසය තුළ රු. 18 000 ක බොල් ණය කපා හැරීමක් පොත් වල වාර්තා නොවීම

අවශ්‍ය වන්නේ,

1. මැයි මාසය සඳහා මුදල් ලැබීම් ජර්නලය හා මුදල් ගෙවීම් ජර්නලය (විශ්ලේෂණ තීරු සහිතව)
2. වැරදි නිවැරදි කිරීම් ජර්නල් සටහන්

3. වැරදි නිවැරදි කිරීමට පෙර ණයගැති පාලන ගිණුම
4. සංශෝධිත ණයගැති පාලන ගිණුම

---

03. ආනන්ද 2016/04/01 දින රු. 200 000 ක මුදලක්ද රු. 240 000 ක් වටිනා ගොඩනැගිල්ලක්ද යොදා වෙළෙඳ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදි. පළමු මාසය තුළ පහත ගණුදෙනු සිදුවී ඇත.

1. මුදලට ගැණුම් රු. 90 000
2. ණයට ගැණුම් රු. 60 000
3. රු. 50 000 ක පිරිවැය වූ බඩු තොගයක් රු. 75 000 කට මුදලට විකුණන ලදි
4. ආපසු යැවුම් රු. 5 000
5. රු. 40 000 ක පිරිවැය වූ බඩු තොගයක් රු. 70 000 කට ණයට විකුණන ලදි
6. 2016/04/15 රු. 120 000 ක් වටිනා කාර්යාල උපකරණ ණයට ගන්නා ලදි
7. සේවක වැටුප් ගෙව්වා රු. 20 000
8. ආනන්ද රු. 25 000 ක් සිය පෞද්ගලික ප්‍රයෝජනයට ගත්තා ලදි
9. ණයගැතියන්ගෙන් මුදල් ලැබුනා රු. 45 000 දුන් මුදල් වට්ටම් රු. 5 000
10. ණයහිමියන්ට රු. 27 000 ක් ගෙවන ලද මුදල් වට්ටම් රු. 3 000 කි
11. සියළු දේපළ පිරියත සරල මාර්ග ක්‍රමයට 20% වාර්ෂිකව ක්ෂය කරයි
12. මාසය අග ණයගැතියන්ගෙන් 10% අඩමාණ ණය වෙන් කිරීමක් පවත්වා ගනී

අවශ්‍ය වන්නේ,

1. ඉහත ගණුදෙනු පහත ආකාරයේ සමීකරණයක් යටතේ සටහන් කර දක්වීම.

| දේපළ පිරියත උපකරණ | + තොගය | + වෙළඳ ලැබිය යුතු දෑ | + මුදල් | = වෙළඳ ගෙවිය යුතු දෑ | + ණය | + හිමිකම් |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

2. 2016/03/31 න් අවසන් මාසය සඳහා ඉහත වෙළඳ ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශණය
3. 2016/03/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශණය

---

04. අ) 2016/06/01 දින මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලද සාරංග ආයතනයේ පහත තොරතුරු සපයා ඇත.

ණයහිමි ලෙජර් සාරාංශය

| ණයහිමියා | ගැණුම් | ලද වට්ටම් | මුදල් ගෙවීම් | 2016/06/30 දිනට ශේෂය |
|---|---|---|---|---|
| අමල් | 40 000 | 2 000 | 30 000 | 8 000 |
| රුවන් | 50 000 | 3 000 | 40 000 | 7 000 |
| චන්ද්‍රික | 30 000 | 1 000 | 20 000 | 9 000 |
| | 120 000 | 6 000 | 90 000 | 24 000 |

අතිරේක තොරතුරු,

1. ගැණුම් ජර්නලයේ එකතුව ගැණුම් ගිණුමේ ණයහිමි පාලන ගිණුමට පිටපත් කර ඇත්තේ රු. 210 000 ක් ලෙසයි.
2. රුවන්ට ආපසු යැවුම් රු. 2 000 ක් පිළිබඳ ණයහිමි ලෙජරයේ හෝ පොදු ලෙජරයේ කිසිම සටහනක් තබා නැත.
3. ණයහිමියන්ගෙන් ලද වට්ටම් ණයහිමි පාලන ගිණුමට බැර කර ඇත. එහෙත් එය නිවැරදිව ලද වට්ටම් ගිණුමේ සටහන් කර ඇත.
4. ණයහිමියන්ට ගෙවීම් රු. 5 000 ක් අඩුවෙන් ණයහිමි පාලන ගිණුමට පිටපත් කර ඇත. එය මුදල් පොතේ නිවැරදිව සටහන් කර ඇත.

අවශ්‍ය වන්නේ,

1. වැරදි නිවැරදි කිරීමේ ජර්නල් සටහන්
2. ඉහත වැරදි නිවැරදි කිරීමට පෙර ණයහිමි පාලන ගිණුම
3. සංශෝධිත ණයහිමි පාලන ගිණුම
4. 2016/06/30 දිනට ණයහිමි උප ලෙජරයේ නිවැරදි ශේෂ ලැයිස්තුව (උප ලෙජරයේ ගිණුම් දක්වීම අනවශ්‍යයයි)

ආ) පහත තොරතුරු ව්‍යාපාර ආයතනය අදාළයි.

1. 2016/03/31 දිනට තෝරා ගත් ලෙජර් ශේෂයන් කිහිපයක්,

| | |
|---|---|
| ණයගැතියෝ | 40 000 |
| බැංකුවේ ඇති මුදල් | 25 000 |
| අඩමාණ ණය වෙන් කිරීම | 4 000 |

2. 2016 මාර්තු මාසයේ බැංකු ප්‍රකාශණයේ පෙන්නුම් කරන එහෙත් ලෙජර් ගිණුම් වල ගැළපුම් නොකරන ලද අයිතම

- ණයගැතියන් ලද සෘජු ප්‍රේෂණ රු. 12 000
- බැංකු ගාස්තු රු. 5 000
- වාහන අලාභයක් වෙනුවෙන් රක්ෂණ වන්දි සඳහා ලද සෘජු ප්‍රේෂණ රු. 30 000
- ගොඩනැගිලි කුලී සඳහා නිත්‍ය නියෝග ගෙවීම් රු. 24 000
- ණයගැතියන්ගෙන් ලැබීම් බැංකුවේ තැන්පත් කල රු. 2 000 ක චෙක්පතක් බැංකුව අගරු කර එවා ඇත

3. 2016/03/31 දිනට උපලබ්ධි නොවූ චෙක්පත් හා ගෙවීමට ඉදිරිපත් නොකල චෙක්පත් පිළිවෙලින් රු. 35 000 ක් හා රු. 18 000 ක් වේ.
4. සෑම මාසයක් අග ණයගැතියන්ගෙන් 10% අඩමාණ ණය වෙන් කිරීමක් පවත්වා ගනී.

අවශ්‍ය වන්නේ,

1. සංශෝධිත මුදල් පොතේ බැංකු ශේෂය (සංශෝධිත මුදල් පොත)
2. බැංකු සැසඳුම් විස්තරය (සංශෝධිත මුදල් පොතේ ශේෂයන් ආරම්භ කර)
3. අඩමාණ ණය වෙන් කිරීම වෙනස් කිරීමේ ජර්නල් සටහන

---

05. අ) ලක්මාල් ආයතනයේ 2016/03/31 දින ඉතිරි තොග පිළිබඳ විස්තර පහත දක්වේ.

| තොග කාණ්ඩය | අයිතම | ඉතිරි ඒකක | ඒකකයක පිරිවැය | ඒකකයක විකුණුම් මිල | ඒකකයක විකුණුම් වියදම් |
|---|---|---|---|---|---|
| A | $A_1$ | 1 000 | 20 | 40 | 10 |
| | $A_2$ | 1 000 | 30 | 32 | 07 |
| B | $B_1$ | 5 000 | 12 | 18 | 03 |
| | $B_2$ | 2 000 | 25 | 30 | 20 |

අවශ්‍ය වන්නේ,

1. අයිතම ක්‍රමයට තොග අගය කරන්නේ නම් ඉතිරි තොගයේ වටිනාකම
2. ඉතිරි තොගයේ පිරිවැය
3. තොග කපා හැරීමක් ඇත්නම් තොග කපා හැරීමේ ජර්නල් සටහන
4. 2016/03/31 දින මූල්‍ය තත්ත්ව ප්‍රකාශණයේ තොගය පෙන්නුම් කරන ආකාරය
5. ආදායම් ප්‍රකාශණයට අදාළව බලපෑම
6. තොග සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශණ වල අනාවරණය කල යුතු කරුණු 2 ක් නම් කරන්න

ආ) සීමිත තරංග සමාගමේ 2016/03/31 දිනෙන් මූල්‍ය වර්ෂය අවසන් වේ. පහත තොරතුරු සපයා ඇත.

| වත්කම | 2015/04/01 දිනට පිරිවැය රු. | 2015/04/01 දිනට ක්ෂය වෙන් කිරීම රු. | ජීව කාලය (අවුරුදු) | සුන්බුන් අගය |
|---|---|---|---|---|
| ඉඩම් | 500 000 | - | - | - |
| ගොඩනැගිලි | 600 000 | 120 000 | 25 | 100 000 |
| මෝටර් රථය | 400 000 | 100 000 | 05 | 150 000 |
| කාර්යාල උපකරණ | 200 000 | 50 000 | 04 | නැත |

ක්ෂය කළ හැකි වත්කම් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරයි.

අමතර කරුණු,

1. ඉඩම් 2016/03/31 දිනට රු. 650 000 කට ප්‍රත්‍යාගණනය කර ඇත.
2. ගොඩනැගිල්ල 2015/04/01 දින රු. 150 000 ක් යොදා වැඩි දියුණු කළ අතර එමගින් එහි සුන්බුන් අගය රු. 130 000 ක් දක්වා වැඩි වේ. ජීව කාලය වර්ෂ 01 කින් වැඩි වේ.
3. මෝටර් රථය 2016/03/31 දින රු. 300 000 කට විකුණා ඇත.

අවශ්‍ය වන්නේ,

1. ඉඩම් ප්‍රත්‍යාගණනය කිරීමේ ජර්නල් සටහන්
2. ගොඩනැගිලි වාර්ෂික ක්ෂය
3. රථ ඉවත් කිරීමේ ගිණුම
4. 2016/03/31 න් අවසන් වර්ෂයට අදාළ මුළු දේපළ ක්ෂය වීම
5. 2016/03/31 න් දින මූල්‍ය තත්ත්ව ප්‍රකාශණයේ ඉහත වත්කම් පෙන්නුම් කරන

25.07.2016

Learning Resource Center
R
De Mazenod College
Kandana

06. අ) කුමාර ආයතනයේ පහත තොරතුරු සපයා ඇත.

1. 2016/06/01 ආරම්භක ශේෂයන්,

| | |
|---|---|
| ගැණුම් | 150 000 |
| විකුණුම් | 300 000 |
| ණයගැතියෝ | 80 000 |
| ණයහිමියෝ | 100 000 |
| කාර්යාල උපකරණ | 200 000 |
| මුදල් ඉතිරිය | 70 000 |
| ප්‍රාග්ධණය | ? |

මාර්තු මාසය තුළ පහත ගණුදෙනු සිදු වී ඇත.

i) ණයහිමියන්ට රු. 20 000 ක් ගෙවා ඇත.
ii) ණයගැතියන්ගෙන් රු. 30 000 ක් ලැබී ඇත.
iii) රු. 50 000 ක් වටිනා කාර්යාල උපකරණයක් ඉන්දික සමාගමෙන් ණයට ගෙන ඇත.
iv) ණයට ගැණුම් රු. 40 000
v) ණයට විකුණුම් රු. 60 000
vi) සේවක වේතන රු. 25 000 ක් ගෙවා ඇත
vii) ණයහිමියන්ට ආපසු යැවුම් රු. 5 000
viii) ණයගැතියන් විසින් ආපසු එවුම් රු. 10 000
ix) අයිතිකරු මුදලින් කල ගැනිලි රු. 15 000

අවශ්‍ය වන්නේ,

1. 2016/06/30 දිනට ශේෂ පිරික්සුම (ලෙජර් ගිණුම පිළියෙල කිරීම අනවශ්‍යයයි)

ආ) පෙරේරා ආයතනයේ 2016 අප්‍රේල් මාසයේ පහත තොරතුරු සපයා ඇත. ආයතනය විදුලි උපකරණ වෙළඳාමේ නිරත වේ.

| | | |
|---|---|---|
| අප්‍රේල් 05 | : | එකක් රු. 50 000 ක මිල ලකුණු කර ඇති පරිගණක යන්ත්‍ර 6 ක් අමල්ගෙන් ණයට ගෙන ඇත. ලද වෙළඳ වට්ටම් 10% |
| අප්‍රේල් 08 | : | එකක් රු. 3 000 බැගින් විදුලි පංකා 10 ක් කුමාරගෙන් ණයට ගෙන ඇත |
| අප්‍රේල් 09 | : | පරිගණක යන්ත්‍ර 2 ක් ආපසු යවා ඇත |
| අප්‍රේල් 11 | : | විදුලි පංකා 3 ක් ආපසු යවා ඇත |
| අප්‍රේල් 12 | : | කාර්යාලයේ ප්‍රයෝජනයට ලකුණු කළ මිල රු. 2 000 ක් වු ලී පුටු 8 ක් ජයදේවගෙන් ණයට ගෙන ඇති අතර ලද වෙළඳ වට්ටම් 5% කි |
| අප්‍රේල් 15 | : | පරිගණක 3 ක් එකක් රු. 60 000 බැගින් ජගත්ට ණයට විකුණා ඇත |
| අප්‍රේල් 16 | : | එකක ලකුණු කල මිල රු. 4 000 බැගින් විදුලි පංකා 5 ක් අරුණට ණයට විකුණා ඇත. දුන් වෙළඳ වට්ටම් 5% කි |
| අප්‍රේල් 19 | : | පරිගණකයක් ආපසු එවා ඇත |
| අප්‍රේල් 24 | : | විදුලි පංකා 2 ක් ආපසු එවා ඇත |
| අප්‍රේල් 22 | : | අමල්ගේ මුළු ණය මුදලට පියවීම මුදල් ගෙවා ඇත. ලද මුදල් වට්ටම් 5% කි |
| අප්‍රේල් 23 | : | කුමාරට ගෙවීමට ඇති මුළු ණය මුදලෙන් 50% ක් ගෙවන ලදි |
| අප්‍රේල් 25 | : | ජයදේවාගේ සම්පූර්ණ මුදල ගෙවන ලදි |
| අප්‍රේල් 26 | : | ජගත්ගෙන් ලැබීමට ඇති මුළු ණය මුදලෙන් 40% ක් ලැබී ඇත |
| අප්‍රේල් 28 | : | අරුණගේ ලැබීම ඇති මුළු ණය මුදල් 20% මුදල් වට්ටම් ලබා දී අය කරගෙන ඇත |

අවශ්‍ය වන්නේ,

1. පහත මූලික පොත් වල ඉහත ගණුදෙනු වර්ග කිරීම,

i) ගැණුම් ජර්නලය ii) විකුණුම් ජර්නලය iii) ආපසු යැවුම් ජර්නලය
iv) ආපසු එවුම් ජර්නලය v) පොදු ජර්නලය

2. පහත ලෙජර් ගිණුම්,

i) දුන් වට්ටම් ගිණුම ii) ලද වට්ටම් ගිණුම

3. මාසය තුළ

i) ගණුදෙනුකරුවන්ගෙන් ලබා ගත් මුළු මුදල ii) සැපයුම්කරුවන්ට ගෙවූ මුළු මුදල